රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
பணிப்பாளர் நாயகம்/பதிவாளர்
Director Genaral/Registrar } 011-2864483

අධ්‍යක්ෂ
பணிப்பாள
Director } 011-2888424

සහකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர்
Asst. Director } 011-2884612

කාර්යාලය
அலுவலகம்
Office } 011 -2877376

ෆැක්ස් :
தொலை நகல
Fax } 011-2884612

(2)

මගේ අංකය
எனது இல.
My No. } VSSO/NGO/VISA/To./Circular

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 30.03.2023

# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
# Ministry of Public Security

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - 15 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.
அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் – 15ஆம்மாடி இ சுஹுருபாய பத்தரமுல்ல.
**National Secretariat for Non-governmental Organizations - 15th Floor, Suhurupaya, Battaramulla.**

විද්‍යුත් තැපැල් மின் அஞ்சல் E-mail:ngosecretariat.gov@gmail.com

**Internal Distribution Only**
**Circular No 09**

To all District Coordinators and the Officers of Visa Division of the Head Office

## <u>Providing Visa Recommendations for the expatriates who arrive to work in NGOs</u>

This circular is issued to further clarify the points mentioned in the Internal Administration Circular No. 01/2008 issued to provide visa recommendations to the foreigners who arrive to work in NGOs registered under the Social Services Organizations (Registration and Supervision) Act No 31 of 1980.

The main objectives of this circular are,

1. To prevent delays in issuing visa recommendations.
2. To provide support and facilities to the expatriates who arrive to work in NGOs to carry out their duties without difficulties.

This circular should be enforced with immediate effect.

**The National Secretariat for Non- governmental Organizations provides visa recommendation only for the NGOs registered in this Secretariat. Further, this Secretariat is not providing recommendations for visa extensions to the expatriates who arrive via certain types of business visa and also tourist visa.**

Procedure for providing visa recommendations;

1. Types of visa:
   I. Entry Visa
      **a.** Short Visit

This visa type will be recommended for less than one month.

**b.** Entry Visa

This visa type will be recommended for one month period from the date of arrival.

II. Residence Visa

This visa type will be recommended for a minimum period of one year after the expire of entry visa.

**02.** After checking all required documents along with dully filled visa requests district coordinators should be forwarded them to the Head Office.

**03.** Visa recommendations for 12 months or for a sufficient period as decided by the Director General will be provided only for the expatriates who are working in the organizations that have been submitted progress reports, action plans, updated staff details, asset reports, cash flow statement, etc.

**04.** It is possible to provide visa recommendation for another one year period with the approval of the Secretary to the Ministry of Defence to the expatriates who completed 3 years of the service. Therefore, the organization must provide a letter explaining the need for further service along with the visa application.

The following documents are required to be submitted for visa recommendations.

| **S/N** | **Document** | **Work Permit** | **Short Visit** | **Entry Visa / Prior Vasa** | **Residence Visa** | **Extension of Work Permit** | **Extension of Residence Visa** |
|---|---|---|---|---|---|---|---|
| 01 | Request letter | √ | √ | √ | √ | √ | √ |
| 02 | 2 Applications (Visa /Work permit) | √ | - | √ | √ | √ | √ |
| 03 | A copy of the passport | √ | √ | √ | √ | √ | √ |
| 04. | A copy of the last visa page | - | - | - | √ | √ | √ |
| 05 | Police clearance | √ | - | √ | - | - | - |
| 06 | Bio data | - | - | √ | - | - | - |
| 07. | Copies of educational certificates | - | - | √ | - | - | - |
| 08. | Appointment letter /service extension letter/invitation letter | - | √ | √ | - | - | √ |
| 09 | 3 passport size photos | - | - | √ | | | |
| 10. | Work schedule | - | √ | √ | - | - | - |
| 11. | Marriage certificate & birth certificate (including dependants) | - | - | √ | | | |
| 12. | A letter to confirm the submission of action plan / progress report | - | - | √ | - | √ | √ |

Short-term entry visa can be applied **online** through the website **www.eta.gov.lk** and is issued to those who are visiting for educational purposes, conferences and monitoring and evaluation purposes. This request should be submitted along with passport copy, appointment letter /invitation letter and work schedule should be submitted. (Accordingly, details of the visa applicants should be sent to the Department of Emigration and Immigration.)

05. After checking the above mentioned documents, clearance should be called from the Ministry of Defence for all visa recommendations other than short term visa. Visa recommendations will not be issued until we received the clearance reports.

06. However, considering the inconvenience faced expatriate due to visa expiry, visa recommendations can only be given for a period of not more than 2 months as per the previous clearance report until the new clearance report is received.

Sanjeewa Wimalagunarathna
Director General / Registrar

රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
பணிப்பாளர் நாயகம்/பதிவாளர் 011-2864483
Director Genaral/Registrar

අධ්‍යක්ෂ
பணிப்பாளர் 011-2888424
Director

සහකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர் 011-2884612
Asst. Director

කාර්යාලය
அலுவலகம் 011 -2877376
Office

ෆැක්ස් :
தொலை நகல 011-2884612
Fax

(1)

මගේ අංකය
எனது இல.
My No. VSSO/NGO/VISA/In. Circular

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 30.03.2023

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**
**பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு**
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - 15 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
**அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் – 15ஆம் மாடி, சுஹுருபாய பத்தரமுல்ல.**
**National Secretariat for Non-governmental Organizations - 15th Floor, Suhurupaya, Battaramulla.**
විද්‍යුත් තැපැල් மின் அஞ்சல் E-mail:ngosecretariat.gov@gmail.com

අභ්‍යන්තර බෙදා හැරීම සඳහා පමණි.

**චක්‍රලේඛ අංක : 09**

සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් සහ ප්‍රධාන කාර්යාලයේ වීසා අංශයේ නිලධාරීන් වෙත.

<u>රාජ්‍ය නොවන සංවිධානවල සේවයට පැමිණෙන විදේශිකයින් සඳහා වීසා නිර්දේශ ලබා දීම.</u>

1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන ( ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානවල සේවයට පැමිණෙන විදේශිකයින් වෙනුවෙන් වීසා නිර්දේශ ලබාදීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පරිපාලන චක්‍රලේඛ අංක 01/2008 හි සඳහන් කරුණු තවදුරටත් පැහැදිලි කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

මෙම චක්‍රලේඛයේ ප්‍රධාන පරමාර්ථ මෙසේය;

1. වීසා නිර්දේශ ලබා දීමේදී ඇති වන ප්‍රමාදයන් වැලැක්වීම පිණිසද;
2. රාජ්‍ය නොවන සංවිධානවල සේවය කිරීමට පැමිණෙන විදේශිකයින් හට අපහසුතාවයකින් තොරව කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය හා පහසුකම් ලබා දීම පිණිසද;

මෙම චක්‍රලේඛය වහාම ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කළ යුතුය.

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය මගින් වීසා නිර්දේශ ලබා දෙනු ලබන්නේ මෙම කාර්යාලයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන සඳහාම පමණි. එසේම ඇතැම් ව්‍යාපාරික වීසා වර්ග (Business Visa) මෙන්ම සංචාරක වීසා ( Tourist Visa) මඟින් රාජ්‍ය නොවන සංවිධාන වෙත පැමිණෙන විදේශිකයින්ගේ වීසා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබාදීම මෙම කාර්යාලය විසින් සිදු නොකරනු ඇත.**

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන වෙත වීසා නිර්දේශ ලබාදීමේ ක්‍රමවේදය.

1) වීසා වර්ග:
   I. පැමිණීමේ වීසා (Entry Visa)
      a. කෙටි කාලීන ප්‍රවේශ වීසා (Short visit)
      මාසයකට අඩු කාලයක් සඳහා මෙම වීසා නිර්දේශ ලබා දෙනු ඇත.

      b. ප්‍රවේශ වීසා (Entry Visa / Prior Visa)
      මෙරටට පැමිණීමේ දින සිට මාසයක කාලයක් සඳහා වීසා නිර්දේශ ලබා දෙනු ඇත.

   II. වාස වීසා ( Residence Visa)
   ප්‍රවේශ වීසා අවසන් වීමෙන් පසුව අවුරුද්දක කාල සීමාවක් සඳහා මෙම වීසා නිර්දේශය ලබා දෙනු ඇත.

02. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිළධාරීන් විසින් වීසා ඉල්ලීම සමඟ ඉදිරිපත් කරන ලේඛණ නිසි පරිදි ලබා දී ඇත්දැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ප්‍රධාන කාර්යාලය වෙත යොමු කල යුතුය.

03. වීසා නිර්දේශ ලබා දීමේදී සංවිධානයේ ප්‍රගති වාර්තා, ක්‍රියාකාරි සැළැස්ම, යාවත්කාලීන කරන ලද සංවිධානයේ තොරතුරු ඇතුළත් වාර්තා, කාර්ය මණ්ඩල වාර්තා, වත්කම් පිළිබඳ වාර්තා හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය යන සංවිධානය විසින් අප කාර්යාලය වෙත ලබාදිය යුතු සියළුම වාර්තා ලබා දී ඇති සංවිධානවල සේවය කරන විදේශිකයින් සඳහා පමණක් මාස 12ක කාලයක් සඳහා හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන ප්‍රමාණවත් කාලයක් සඳහා හෝ වීසා ලබාදීමට කටයුතු කළ යුතුය.

04. සංවිධානයක සේවය කරන විදේශිකයින්ගේ සේවා කාලය වසර 03ක් සම්පූර්ණ වීමෙන් පසුව, තවදුරටත් ඔවුන්ගේ සේවා අවශ්‍යතාවය පිළිබඳව සංවිධානය විසින් පැහැදිලි කිරීමෙන් අනතුරුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය මත තවත් වසරක කාලයක් සඳහා වීසා නිර්දේශ ලබාදීමට හැකි වේ.

වීසා නිර්දේශ ලබාදීමේදී පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වන අතර ඒ පිළිබඳව ඔබ විසින් පරීක්ෂා කළ යුතු වේ.

| අංක | ලේඛන වර්ගය | වැඩ බලපත්‍රය (Work Permit) | කෙටි කාලීන ප්‍රවේශ වීසා (Short Term Entry Visa) | ප්‍රවේශ වීසා (Entry/Prior Visa) | වාස වීසා (Residence Visa) | වැඩ බලපත්‍ර දීර්ඝ කිරීම (Extension of Work Permit) | වාස වීසා දීර්ඝ කිරීම (Extension of Residence Visa) |
|---|---|---|---|---|---|---|---|
| 01 | ඉල්ලීම් ලිපිය | √ | √ | √ | √ | √ | √ |
| 02 | අයදුම්පත් දෙකක් (වීසා /වැඩ බලපත්‍ර) | √ | - | √ | √ | √ | √ |
| 03 | විදේශ ගමන් බලපත්‍රයේ පිටපත | √ | √ | √ | √ | √ | √ |
| 04. | අවසාන වීසා පිටුවේ පිටපත | - | - | - | √ | √ | √ |
| 05 | පොලිස් නිශ්කාෂණය | √ | - | √ | - | - | - |
| 06 | ජීව දත්ත | - | - | √ | - | - | - |
| 07. | අධ්‍යාපන සහතික පිටපත් | - | - | √ | - | - | - |
| 08. | පත්වීම් ලිපිය /දීර්ඝ කිරීමේ ලිපිය/ආරාධනා ලිපිය | - | √ | √ | - | - | √ |
| 09 | විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ ඡායාරූප 3ක්. | - | - | √ | | | |
| 10. | වැඩ කාලසටහන | - | √ | √ | - | - | - |
| 11. | විවාහ සහතිකය හා උප්පැන්න සහතිකය ( යැපෙන්නන් ඇතුළුව) | - | - | √ | | | |
| 12. | ක්‍රියාකාරී සැලැස්ම / ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම තහවුරු කිරීමේ ලිපිය | - | - | √ | - | √ | √ |

සැ.යු: කෙටි කාලීන ප්‍රවේශ වීසා ලබා දීම සිදු කරනු ලබන්නේ අධ්‍යාපන, සම්මන්ත්‍රණ හෝ අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශිකයින් සඳහාය. ඒ සඳහා ඉල්ලීම් ලිපිය, විදේශ ගමන් බලපත්‍ර පිටපත, පත්වීම් ලිපිය/ආරාධනා ලිපිය සහ වැඩ කාලසටහන ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. මේ අනුව වීසා අයදුම් කිරීම www.eta.gov.lk යන වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ සිදු කිරීමට ආගමන විගමන පාලක ජනරාල් විසින් අවස්ථාව සළසා දී ඇත. ඒ අනුව වීසා අයදුම් කරන විදේශිකයින් පිළිබඳ තොරතුරු අප විසින් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතුය.

05. සංවිධානය විසින් ලබා දී ඇති ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව,කෙටි කාලීන ප්‍රවේශ වීසා හැර අනෙකුත් වීසා නිර්දේශ ලබා දීමට ප්‍රථම ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිශ්කාෂණ වාර්තා කැඳවීමක් සිදු කළ යුතු අතර නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් වීසා නිර්දේශ නිකුත් කරනු නොලැබේ.

06. නමුත් ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ලැබෙන තෙක් වීසා අවසන් වීම හේතුවෙන් විදේශිකයා පත්වන අපහසුතාවය සැලකිල්ලට ගෙන, පෙර නිශ්කාෂණ වාර්තාව පදනම්ව ඉදිරි මාස 02කට නොවැඩි කාලයක් සඳහාත්, ආරක්ෂණ නිශ්කාෂණ වාර්තා ලැබීමෙන් පසුව, ඉතිරි කාලය සඳහාත් වීසා නිර්දේශ ලබා දෙනු ලැබේ .

සංජීව විමලගුණරත්න,
අධ්‍යක්ෂ ජනරාල් / ලේඛකාධිකාරී